# වැවිලි අමාත්‍යාංශය

# ජාතික වැවිලි කළමනාකරණ ආයතනය

## මෙම ආයතනයේ පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් සහිත ශ්‍රී ලාංකිකයන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

### 01. සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) -MM 1.1 (II ශ්‍රේණිය)

**රැකියා විස්තරය** : ආයතනයේ සියලු සාමාන්‍ය පරිපාලන කටයුතු පිළිබඳව වගකිව යුතු වේ.

**සුදුසුකම්** : **බාහිර අයදුම්කරුවන් සඳහා**

පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගත් ව්‍යාපාර / රාජ්‍ය පරිපාලනය / කළමනාකරණය / වාණිජ්‍යය / ආර්ථික විද්‍යාව යන ක්ෂේත්‍රයන්හි පන්ති සාමාර්ථයක් සහිත උපාධිය සහ එම උපාධි සුදුසුකම් ලබා ගැනීමෙන් පසුව පිළිගත් රාජ්‍ය සංස්ථා/මණ්ඩල/රාජ්‍ය දෙපාර්තමේන්තුවක හෝ පෞද්ගලික ආයතනයක සාමාන්‍ය පරිපාලනයට අදාළව අවම වශයෙන් වසර තුනක (03) සේවා පළපුරුද්ද,

හෝ

පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගත් ව්‍යාපාර / රාජ්‍ය පරිපාලනය / කළමනාකරණය / වාණිජ්‍යය / ආර්ථික විද්‍යාව යන ක්ෂේත්‍රයන්හි විශේෂ උපාධිය සහ එම උපාධි සුදුසුකම් ලබා ගැනීමෙන් පසුව පිළිගත් රාජ්‍ය සංස්ථා/මණ්ඩල/රාජ්‍ය දෙපාර්තමේන්තුවක හෝ පෞද්ගලික ආයතනයක සාමාන්‍ය පරිපාලනයට අදාළව අවම වශයෙන් වසර පහක (5) සේවා පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා**

අදාළ ක්ෂේත්‍රයේ කණිෂ්ඨ කළමනාකරණ (I ශ්‍රේණිය) තනතුරක වසර පහක (05) සේවා පළපුරුද්ද.

**වැටුප් පරිමාණය** : MM 1.1-2016, Rs.[53,175-10X1,375-15X1,910-95,575]

(ආරම්භයේ දී රු. 53,175/- හා රජයේ අනුමත අනෙකුත් දීමනා වලට හිමිකම් කියනු ලැබේ.)

**වයස් සීමා** : වයස අවුරුදු 25 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. රාජ්‍ය සේවයේ නියුතුවූවන් සඳහා මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

**බඳවාගැනීමේ ක්‍රමවේදය** : වෘත්තීයවේදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

පොදු කරුණු අයදුම්කරුවන්ට ඉංග්‍රීසි භාෂාව මනා ලෙස හැසිරවීමේ හැකියාව හා පරිගණක සාක්ෂරතාවය තිබිය යුතුය.

### 02. නේවාසිකාගාර කළමනාකරු -JM 1.1 (II ශ්‍රේණිය)

**රැකියා විස්තරය**

: නේවාසිකාගාරයට අයත් සියලුම දේපල නඩත්තු කිරීම, නේවාසිකාගාර කාර්ය මණ්ඩලයට රාජකාරි පැවරීම හා අධීක්ෂණය කිරීම, ආහාරපානවල ගුණාත්මක භාවය තහවුරු කිරීම, නේවාසිකාගාරයේ භාණ්ඩ, උපකරණ හා කාමර නිසි පරිදි පවත්වා ගැනීම, අභ්‍යන්තර/බාහිර පුහුණු වැඩ සටහන් හා අධ්‍යයන පාඨමාලා සඳහා සහභාගිවන්නන්හට ආහාරපාන හා නවාතැන් පහසුකම් ලබා දීම, කළමනාකාරිත්වය විසින් පවරනු ලබන වෙනත් රාජකාරි කටයුතු සිදු කිරීම

**සුදුසුකම්** : **බාහිර අයදුම්කරුවන් සඳහා**

පිළියගත් ආයතනයකින් ලබා ගත් හෝටල් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව සමග එම සුදුසුකම් ලබා ගැනීමෙන් පසුව පිළිගත් හෝටලයක අවම වශයෙන් වසර පහක (05) සේවා පළපුරුද්ද

හෝ

ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය හෝ වෙනත් පිළිගත් හෝටල් පාසලකින් ලබා ගත් හෝටල් පාසල් ඩිප්ලෝමාව සමග අ.පො.ස (සා.පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා**

අ.පො.ස (උ.පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම හා කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන (I ශ්‍රේණිය) තනතුරක අවම වශයෙන් වසර පහක (05) සේවා පළපුරුද්ද සමග මාස 03 ක හෝටල් පාලනය / කළමනාකරණය පිළිබඳ හෝ අදාළ වෙනත් පාඨමාලාවක් සාර්ථකව නිම කර තිබීම.

**වැටුප් පරිමාණය** : JM 1.1-2016, Rs. [42,600-10X755-18X1,135=70,580]

(ආරම්භයේ දී රු. 42,600/- හා රජයේ අනුමත අනෙකුත් දීමනා වලට හිමිකම් කියනු ලැබේ.)

**වයස් සීමා** : වයස අවුරුදු 25 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. රාජ්‍ය සේවයේ නියුතු වූවන් සඳහා මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

**බඳවාගැනීමේ ක්‍රමවේදය** : ලිඛිත තරගකාරී විභාගයක් සහ වෘත්තීයවේදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**පොදු කරුණු** : අයදුම්කරුවන්ට ඉංග්‍රීසි භාෂාව මනා ලෙස හැසිරවීමේ හැකියාව හා පරිගණක සාක්ෂරතාවය තිබිය යුතුය.

**වෙනත් ප්‍රතිලාභ**

- සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට පිළිවෙලින් මූලික වැටුපෙන් 12% ක හා 3% ක දායකත්වයක් ආයතනය විසින් ලබා දෙනු ලැබේ.

  (සේවක අර්ථසාධක අරමුදල සඳහා සේවක දායකත්වය මූලික වැටුපෙන් 10% කි)
- සාමාජිකයා හා ඔහුගේ ළඟම පවුලේ සාමාජිකයින් සඳහා දායකත්ව සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය
- ආසන්නම නගර සඳහා ප්‍රවාහන පහසුකම් (කඩුවෙල/ කොට්ටාව)

**අයදුම් කරන පිළිවෙල**

ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සහිත ඔබගේ සම්පූර්ණ ජීව දත්ත සටහන, **අදාළ සහතිකවල පිටපත් සහිතව** ලියාපදිංචි තැපැලෙන් පහත සඳහන් ලිපිනයට **2020 සැප්තැම්බර් මස 04** වන දින හෝ ඊට පෙර ලැබීමට සැලැස්විය යුතුය. රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ අයදුම්පත් අදාළ ආයතනයේ ප්‍රධානීන් මගින් යොමු කළ යුතු වේ. අයදුම්පත් බහාලන කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබා තනතුර සඳහන් කළ යුතුය. කිනම් තත්වයක් යටතේ වුව ද අසම්පූර්ණ හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් භාර නොගන්නා අතර, කිසිදු ආකාරයකින් බලපෑම් කිරීම හෝ ඊට තැත් කිරීම අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතු වේ.

**අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී,**
**ජාතික වැවිලි කළමනාකරණ ආයතනය,**
**එම්.ඩී.එච්. ජයවර්ධන මාවත,**
**අතුරුගිරිය.**
**දුරකථනය : 011-2770232**

Source: Dinamina, Daily News (2020.08.22)